# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 2471/07 – 2026 ජනවාරි මස 12 වැනි සඳුදා – 2026.01.12**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2025 අංක 140 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/18/2019/WS/257.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KDS/KUN/4/7/16/4/97.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2025 දෙසැම්බර් මස 19 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

උපලේඛනය

I. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.–** ප්‍රාදේශීය ලේකම්, කුණ්ඩසාලේ.

II. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 646, ගල්පිහිල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගල්පිහිල්ල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක MAHA/KND/2023/506 හා 2024.11.01 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – ගල්පිහිල්ල රාජ්‍ය වතුයාය – ප්‍රමාණය: හෙක්. 0.0134**

උතුරට: මාර්ගය සහ රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන ගල්පිහිල්ල රාජ්‍ය වතුයාය; නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.); දකුණට: රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන ගල්පිහිල්ල රාජ්‍ය වතුයාය; බටහිරට: මාර්ගය.

EOG 01 – 0108


1A – G 046067 – 13 (2026/01)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (ආ) අතුරු විධානය යටතේ ආඥාව

**2025 අංක 141 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/18/2021/WS/377.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: RUW/LAN/ACQTN/A2/271.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (ආ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම්, එම උපලේඛනයේ II වැනි ඡේදයේ අනුරූප සටහනේ විස්තරව ඇති පරවශතාවයට යටත් වන බව මෙම ආඥාවෙන් ප්‍රකාශයට පත් කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2025 දෙසැම්බර් මස 19 වැනි දින.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැඳුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

උපලේඛනය

I. **ඉඩමේ විස්තරය.**– සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 105A රුවන්වැල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සියඹලාවල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක KE/RWN/2024/160 හා 2025.03.19 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

II. **පරවශතාවේ විස්තරය.**– රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ජල ගබඩා ටැංකියට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීමට අවශ්‍ය පුද්ගලික මාර්ග කොටසක පරවශතා අයිතිය අත්කර ගැනීම.

1. කැබලි අක්ෂර 'A' – පීටර්හිල්වත්ත – ප්‍රමාණය: **හෙක්. 0.0028**

උතුරට: මාර්ගය (ප්‍රාදේශීය සභා); නැගෙනහිරට: එම්. අබේරත්න සහ ආර්. එම්. සිරිල් හිමිකම් කියන පීටර්හිල්වත්ත; දකුණට සහ බටහිරට: මාර්ගය.

EOG 01 – 0109

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2023 අංක 25 දරන ආඥාව**

ඉඩම් අමාත්‍යාංශයේ අංකය: 4-3/5/2020/HW/305.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: පා/ඉ/2/අත් 49.

අංක 2323/05 හා 2023.03.13 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පිටු අංක 1Aහි භාෂාත්‍රයෙන් පළකරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ ප්‍රකාශයෙහි ඉඩමේ විස්තරයෙහි සර්වේයර් ජනරාල්ගේ අංකය සිංහල භාෂාවෙන් "සීඕ/එෆ්ඩීකේ/2021/363" ලෙස වැරදීමකින් සටහන් වීම "සීඕ/පීඩීකේ/2021/363" ලෙස ද, දෙමළ භාෂාවෙන් සර්වේයර් ජනරාල්ගේ අංක "CO/FDK/2021/363" යන්න "CO/PDK/2021/363" ලෙස ද, ඉංග්‍රීසි භාෂාවෙන් සර්වේයර් ජනරාල්ගේ අංක "CO/DFK/2021/363" යන්න "CO/PDK/2021/363" ලෙස ද නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2025 දෙසැම්බර් මස 19 වැනි දින.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
"මිහිකත මැඳුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 01 – 0110

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.